# රූපික තර්ක ශාස්ත්‍රයේ සංකේත භාවිතය ආශ්‍රිත ගැටලු

# Problems associated with the use of symbols in Formal Logic

FACULTY OF GRADUATE STUDIES
28 JUL 2014
UNIVERSITY OF KELANIYA

කේ. ඒ. තරංග ධරණිත B.A.(Hons.), M.S.Sc.
FGS/03/01/07/2008/01

දර්ශන විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී

කැලණිය විශ්ව විද්‍යාලය



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 894 |
| වර්ග අංකය: | |



2013 මැයි මස

# නිබන්ධ සාර සංග්‍රහය

බටහිර තර්කනය ඇසුරෙහි දක්නට ලැබෙන විවිධ තාර්කික භාවිතයන් අතර ප්‍රමුඛස්ථානයක් රූපික තර්ක ක්‍රමයට හිමි වෙයි. එය නිගාමී තර්කනයෙහි අග්‍ර ඵලයක් ලෙස සැලකේ. සංයුක්ත චින්තනය වියුක්ත කොට දක්වන විවිධ ශෛලීන් එමගින් උගන්වනු ලැබේ.

තාර්කික චින්තනය රූපයකට ගොනු කිරීම පහසු කාර්‍යයක් නොවේ. ඒ සඳහා රූපික භාෂාව හැඳෑරිය යුතුය. රූපය ඉස්මතු කොට දක්වන්නේ එකී භාෂාවයි. එය වූ කලී සංකේතාත්මක භාෂාවක් වේ. එම භාෂාවේ ස්වභාවය, භාවිතය හා ඒ ආශ්‍රිත රීති පිළිබඳ අවබෝධයක් නොවූ කල චින්තනය ව්‍යාකූල වේ. වත්මන් තර්ක ශාස්ත්‍රය ඇසුරෙහි එම දූර්වලතාව ඉහලින් කැපී පෙනේ. එබැවින් මෙම නිබන්ධනයේ මුඛ්‍යාර්ථය උක්ත කාරණා විචාරශීලී පදනමකින් ගෙන ඇගැයීම වේ. ඒ සඳහා සංකල්පීය වශයෙන් විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් භාවිතයට ගන්නා ලද අතර නිබන්ධනය අවසානයේ බටහිර තර්කනයෙහි ඇතැම් තන්හි විවිධ තාර්කික දෝෂයන් රැසක් දක්නට ලැබෙන බවත් ශාස්ත්‍රිය ප්‍රගමනය උදෙසා දේශීය වශයෙන් සැලකිය යුතු දායකත්වයක් මෙතෙක් සිදුවී නොමැති බවත් වැදගත් සංකල්පීය කාරණා රැසක් නිවැරදි අයුරින් නිර්වචනය වී නොමැති බවත් තහවුරු විය.

මූල පද රූපික තර්කනය

තාර්කික සංකේත

සප්‍රමාණතාව

නිගාමී